# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම 1 තිමෝති 3: 1 – 13

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.

"සභා නායක තෙමේ නිදොස් චරිතයකින් යුත් තැනැත්තෙකු විය යුතු යි."

යමෙක් සභාවේ නායක තනතුර දැරීමට ආශා වන්නේ නම්, හෙතෙම යහපත් වැඩක් කිරීමට කැමැති වන්නේ ය යන කීම සැබෑ වේ. එහෙයින් සභා නායක තෙමේ නිදොස් චරිතයකින් යුත්, එක භාර්යාවක් ඇති පුරුෂයකු ද, තැන්පත්, සන්සුන්, ආචාර සම්පන්න, ආගන්තුක සත්කාරයට කැමැති, උගන්වන්නට සමර්ථ තැනැත්තෙකු ද විය යුතු යි. ඔහු බීමත්කමින් තොර, නොකිපෙන සුළු ඉවසිලිවන්ත, සාමකාමී, මුදල් තණ්හාව නොමැති, සිය පවුල මැනවින් පාලනය කරන, තම දරුවන් හික්මවා ගන්න, ප්‍රතිපත්ති ගරුක තැනැත්තෙකු විය යුතුයි. යමෙක් තමාගේ ම පවුල හසුරුවා ගන්නට නොදෙන්නේ නම්, ඔහු දෙවියන් වහන්සේගේ සභාවේ වගකීම දරන්නේ කෙසේද? ඔහු ළඟදී ක්‍රිස්තු භක්තිය වැළඳගත්තකු නොවිය යුතුයි. මන්ද, එවැන්නකු උඩඟු කමින්, යක්ෂයාට පැමිණි දඬුවමට පත්විය හැකි නිසා ය. ඔහු සභාවෙන් පිට අය විසින් ගරු කොට සලකනු ලබන්නකු ද විය යුතුයි. එසේ නොවේ නම් හොඳ නම නැති කරගෙන, යක්ෂයාගේ උගුලට අසුවන්නේ ය.

එසේ ම, උපස්ථායකයන් සන්සුන්, දෙයාකාර කතා නැති, පමණ ඉක්මවා මත්පැන් පානය නොකරන, අයුතු ලාභයට ලොල් නොවූ, ඇදහිල්ලේ අභිරහස පිරිසිදු හෘදය සාක්ෂියකින් දරණ තැනැත්තෙකු විය යුතුයි. උපස්ථායකයන් ලෙස සේවය කිරීමට ඉඩ දිය යුත්තේ කලින් සෝදිසි කර බලා, ඔවුන්ට විරුද්ධව කිසිවක් නොමැති අයට පමණි. එසේම ස්ත්‍රීවරුන් ද, ගෞරවය

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# අඟහරුවාදා

ලැබීමට සුදුසු වූ, ඕපාදූප නොකියන, තැන්පත් විශ්වාස කටයුතු අය විය යුතුයි. උපස්ථායකයා එකම භාර්යාවක් ඇති පුරුෂයකු ද, සිය දරු පවුල මැනවින් රැක බලාගන්නා වූ ද, තැනැත්තෙකු විය යුතුයි. යහපත් ලෙස සේවය කර, උසස් තත්ත්වයක් ලබා ගන්නා උපස්ථායකයන්ට, ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ කෙරෙහි වූ ඇදහිල්ල ගැන නිර්භීත ලෙස කතා කරන්නට පිළිවන් වෙයි.

දේව වචනය මෙසේ ය.

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# අඟහරුවාදා

## පිළිතුරු ගීය ගීතාවලිය 101: 1–3, 5–6

පිළිතුර: පිරිසිදු හදින් නිදොස් මඟෙහි මම ගමන් කරන්නෙමි.

ගීය: කරුණාව හා යුක්තිය ගැන මම ගී ගයන්නෙමි.
සමිඳුනි, ඔබ හට පැසසුම් ගී ගයන්නෙමි.
නිදොස් මඟෙහි සිහි නුවණින් ගමන් කරන්නෙමි.
ඔබ කවදා මා වෙත වඩින සේක් ද?

පිරිසිදු සිතින් මාගේ නිවසෙහි මා වාසය කරන්නෙමි.
මාගේ ඇස් කිසි නීච දෙයක් කෙරෙහි නොරඳවන්නෙමි.
දෙවිඳුන් කෙරෙන් ඈත් වන්නන්ගේ ක්‍රියා මම නුරුස්සන්නෙමි.
ඒවාට මම ඇලුම් නොවන්නෙමි.

සිය අසල්වැසියාට විරුද්ධව
රහසින් අපවාද දොඩන්නා මම වනසන්නෙමි.
උඩඟු බැල්ම හා අහංකාර සිත ඇත්තා මම නුරුස්සන්නෙමි.

මා සමඟ වසන පිණිස මම දේශයෙහි සැදැහැවතුන් තෝරා ගනිමි.
නිදොස් ලෙස දිවි ගෙවන්නෝ මාගේ සේවකයෝ වන්නෝ ය.

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# අඟහරුවාදා

## සුසුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
ජේසුස් ක්‍රිස්තුස් ස්වාමීන් වහන්සේ මරණයේ බලය බිඳ දමා, ජීවනයත්, අමරණීයභාවයත් සුබ අස්න මගින් හෙළි කර වදාළ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටියි.
දෙවියන් වහන්සේ සිය සෙනඟ ගළවන්ට වැඩිය සේක.
ආලේලූයා!

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# අඟහරුවාදා

## සුවිශේෂය ලූක් 7: 11–17

ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"යෞවනය, නැඟිටින්නැ යි මම ඔබට කියමි."

ජේසුස් වහන්සේ නායිම් නම් නුවරකට වැඩිය සේක. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ ද මහත් සමූහයක් ද උන්වහන්සේ පිරිවරා ගියහ. උන්වහන්සේ නුවර දොරටුවට ළං වූ කල මළ මිනිසෙක් පිටතට ගෙනන ලද්දේය. මළ තැනැත්තේ සිය මවගේ එකම පුත්‍රයා ය. ඈ ද වැන්දඹුවකි. නුවරවාසී විශාල පිරිසක් ඈ සමඟ ආහ. ස්වාමින් වහන්සේ ඈ දැක අනුකම්පා කොට, "හැඬීම නවත්වන්නැ"යි වදාළ සේක. උන්වහන්සේ ළං වී දෙණට අත තැබූ සේක. එවිට දෙණ උසුලන්නෝ ද නැවතුණාහ. උන්වහන්සේ "යෞවනය නැඟිටින්නැයි මම ඔබට කියමි"යි වදාළ සේක. එවිට මළ මිනිසා නැඟිට හිඳගෙන කතා කරන්නට පටන් ගත්තේය. උන්වහන්සේ ඔහු සිය මෑණියන්ට භාර දුන් සේක. එකල සියල්ලෝම බිය පත්ව ශ්‍රේෂ්ඨ දිවැසිවරයෙක් අප අතර පහළ වී සිටියි. දෙවියන් වහන්සේ සිය සෙනඟ ගලවන්නට වැඩිය සේකැයි කියමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ. උන්වහන්සේ ගැන මේ පුවත මුළු ජුදයෙහි ද අවට පෙදෙස්වල ද පැතිර ගියේය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.